# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,706 — 1966 ජූලි 29 වැනි සිකුරාදා — 1966.7.29**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 545 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 546 | අය–වැය ලේඛන .. .. .. | 554 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 549 | ඉඩ්පළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. | 552 | මාර්ග කොමිටි දන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම් .. | 553 | විවිධ දන්වීම් .. .. .. | 556 |


## පළාත් පාලන නිවේදන

එල්.ඕ.—බී 31/47.

**ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත**

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තිය යටතේ, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව යි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ජූලි මස 21 වන දින,
කොළඹ දී ය.

**ආඥාව**

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව සම්බන්ධයෙන් ඡන්ද ලැයිස්තු සකස් කිරීම පිණිස, ඉහත කී ආඥාපනත යටතේ මේ දක්වා කර ඇති සෑම ක්‍රියාවක් ම අවලංගු සහ බල රහිත විය යුතුවාක් මෙන් ම, සෑම විටම එසේ අවලංගු සහ බල රහිත වී ඇතැයි සැලකිය යුතුය ;

තවද,

(ආ) කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරයා විසින් දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ ඡන්ද ලැයිස්තු ප්‍රතිශෝධනය කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් නියම කළ හැකි දිනවල දී ඡන්ද ලැයිස්තු ප්‍රතිශෝධනය ආරම්භ කර, ඒ ලැයිස්තු ඒ ආඥාපනතේ 22 වැනි වගන්තිය යටතේ සහතික කළ යුතුය.

7–1642—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩී.—බී 67/36.

## පනාවල් කෝරලේ (නැගෙනහිර සහ බටහිර) ගම්සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය) වන ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥා පනතේ 3 වැනි වගන්තියෙන් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති වරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 ජූලි මස 7 වැනි දින,
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥා පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 1964 පෙබරවාරි 16 වැනි දින අංක 12,934 දරන ගැසට් පත්‍රයේ පළවූ ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථා, පනාවල් කෝරලේ (නැගෙනහිර සහ බටහිර) ගම්සභාවේ පාලනසීමා ඇතුළත වූ ප්‍රදේශයට අදාළවන ප්‍රමාණයට, එහි අ 3 ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" අ 3 (1) මුදල් අයකර පුද්ගලයන් ඇතුළත් කරගනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සඳහා යම්කිසි ගොඩනැගිල්ලක් හෝ ඉඩිකිරිමක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් බලපත්‍රයක් ඉල්ලා සිටින අයදුම්කරුවකු විසින්, තමා වෙත එකී බලපත්‍රය නිකුත් කරනු ලැබීමට පෙර, පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලන ලද ගාස්තුවක් සභාවට ගෙවිය යුතුය."

| | එක් දිනකට | එක් මසකට | දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන එක් අවුරුද්දකට |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ආසන පහසුකම් සැපයෙන පුද්ගලයන්ගේ ගණන 199 දෙනකුට වැඩි නොවන කල්හි ... ... | 3 0 | ... 30 0 | ... 75 0 |
| ආසන පහසුකම් සැපයෙන පුද්ගලයන්ගේ ගණන 199 දෙනකුට වැඩි, එහෙත් 399 දෙනෙකුට වැඩි නොවන කල්හි ... ... | 5 0 | ... 40 0 | ... 90 0 |
| ආසන පහසුකම් සැපයෙන පුද්ගලයන්ගේ ගණන 399 දෙනකුට වැඩිවූ විට | 10 0 | ... 60 0 | ... 150 0 |

7–1649—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥා පනත

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥා පනතෙහි 13(1) වැනි වගන්තියෙන් මාවෙත පැවරුන බලතල ප්‍රකාර, මහනුවර පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ලියන මුදියන්සේලාගේ සමරසිංහ වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගඟ ඉහළ ගම්සභාවේ අංක 21 දරණ කොට්ඨාශයෙහි සභික මැදගෙදර මුදියන්සේලාගේ පල්ලෙ ගෙදර පුංචි අප්පුහාමි මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කරගැණීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගඟ ඉහළ ගම්සභාවේ අංක 21 දරණ කොට්ඨාශයෙහි සභික මැදගෙදර මුදියන්සේලාගේ පල්ලෙ ගෙදර පුංචි අප්පුහාමි මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරිනලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

ලි. මු. සමරසිංහ,
මහනුවර පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966 ජූලි 13 වෙනි දින,
මහනුවර ප. පා. කාර්යාලයේදීය.

7–1650—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දැරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් බන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්‍ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවක් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

**4. නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්‍ෂා කාලය

———————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදෑහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම ලැබූ දින හා ආයතනවල නම :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිහත් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

ශ්‍රේණාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්බරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### නාගරික රස පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු කොළඹ නාගරික සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලබන අතර, කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 4,080—12×360 සහ 10×480—රු. 13,200. වර්ෂයකට රු. 8.400 ට සහ රු. 11,760 පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව සහ වර්ෂයකට රු. 11,280 වේ දැවුරුදු තැවැත්මක්.

පශ්චාත් උපාධි සුදුසුකම් නොමැති අයට වර්ෂයකට රු. 8,400 න් ඔබ්බට යා නොහැක.

ඒ. ආර්. අයි. සී. ලත් අයට වර්ෂයකට රු. 5,160 ආරම්භක වැටුපක් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්—අවශ්‍ය සුදුසුකම්.—අයදුම්කරුවෝ පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව පිළිබඳ 1 වැනි පන්තියේ හෝ 2 වැනි පන්තියේ හෝ ගෞරව සහිත උපාධියක් හෝ ආහාර, ඖෂධ සහ ජලය විශ්ලේෂණය පිළිබඳ පස් අවුරුදු පළපුරුද්දක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සංගමිකයන් විය යුත්තාහ.

4. තනතුර ස්ථිරයි, විශ්‍රාම වැටුප් සහිතයි. තෝරාගනු ලබන අයදුම්කරුට පෞද්ගලික ව්‍යාපාරයෙහි යෙදීමට අවසර නැති අතර, අවශ්‍ය වෙයි නම් සහ අවශ්‍ය වූ විටක පෝය දිනයන්හි සහ රජයේ නිවාඩු දිනයන්හි රාජකාරි කළයුතු වෙයි.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, මා වෙත 1966. 8. 17 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදා ගත යුතුය :—

"13(අ) ආහාර ඖෂධ හා ජලය විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද (සම්පූර්ණ විස්තර සඳහන් කරන්න, දින සහිතව) :
————.

(ආ) වායු විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද ඇත්නම් ඒ ගැන විස්තර සඳහන් කරන්න." :————.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූලි මස 18 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේදී ය.

7–1630—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන විදුලි ෆෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1966

පළාත් පාලන විදුලි ෆෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගයක් පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් කොළඹදී පවත්වනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය පසුව දන්වනු ලැබේ.

2. (i) **වැටුප් ක්‍රමය.**—සමත්වන අයදුම්කරුවන් රුපියල් 834න් පටන්ගෙන රු. 42 බැගින් වැඩිවීම් 18කින් යුක්තවූ රුපියල් 1,590 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි, පළාත් පාලන විදුලි ෆෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට පුරප්පාඩු ඇතිවන අන්දමට පත්කරනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ වර්ෂයකට රුපියල් 1,254 ට නැගුමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් තිබේ. රජයේ ප්‍රමාණයන්ට හා කොන්දේසි අනුව ගෙවල් කුලී දීමනාද, තාවකාලික ජීවන වියදම් දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා ද ගෙවනු ලැබේ.

(ii) **සේවාව පිළිබඳ කොන්දේසි.**—

(ඒ) තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තවද තෝරාගනු ලබන අපේක්ෂකයෝ පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ප්‍රයෝජන ලැබීමට සුදුස්සෝ වෙත් ;

(බී) නිවාඩු දීම හා අනිකුත් සේවා කොන්දේසි පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන (264 වැනි පරිච්ඡේදය) හා ඒ යටතේ සම්පාදිතව වෙනත් රෙගුලාසිවලට සහ ප්‍රාදේශීය බලමණ්ඩල අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුව නිගමනය කරනු ලැබේ ;

(සී) සමත්වන අයදුම්කරුවෝ අවුරුදු තුනක ආධුනික කාල පරිච්ඡේදයක් යටතේ පත් කරනු ලබන අතර, ඔවුහු ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට පත් කිරීමට පුළුවන. ඔවුහු පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධානවලටත් (264 වැනි පරිච්ඡේදය) එම ආඥාපනත පිළිබඳව කරනු ලබන වැඩිදුර සංශෝධනයන්ට හා ඒ අනුව පනවන රෙගුලාසිවලටත් කලින් කලට සම්මත කරන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි ;

(ඩී) පළාත් පාලන සේවයේ ස්ථිරවූත් විශ්‍රාම වැටුප් සහිතවූත් තනතුරු දරණ තෝරාගනු ලබන අපේක්ෂකයින් පළාත් පාලන සේවා රෙගුලාසිවල අංක 22 (2) දරණ රෙගුලාසිය අනුව වැඩ බැලීමේ පදනමක් මත පත්කරනු ලැබේ. ඔවුන් සිය තනතුරුවල ස්ථිර කිරීම වැඩ බැලීමේ කාල සීමාව අවසානයේදී සලකා බලනු ලැබේ. වැඩ බැලීමේ කාල සීමාව, ප්‍රථම අවස්ථාවේදී හය මාසයකට සීමාවේ ;

(ඊ) දෙවැනි ශ්‍රේණියේ ෆෝර්මන්වරුන්ගේ මූලික වැටුපට වැඩි වැටුපක් ලබන ප්‍රාදේශීය බලමණ්ඩලයක අඛණ්ඩ සේවයක් ඇති, සමත්වන අයදුම්කරුවන් මෙම වැටුප් ක්‍රමයේ සුදුසු පෙත්තක පිහිටුවනු ලැබේ ;

(එෆ්) සමත්වන අයදුම්කරුවන් පත්වීම ලැබීමෙන් පසුව තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සීමාව තුළ පදිංචි විය යුතුයි ;

3. (i) සමත්වන අයදුම්කරුවන් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටම සම්පාදනය කොට ඇති හෝ මින්මතු සම්පාදනය කළ හැකි ව්‍යවස්ථාවන්ට එකඟව ක්‍රියා කළ යුතුය ;

(ii) ආධුනික සේවා කාලය තුළදී සිංහල භාෂා විෂයයෙහි ප්‍රවීණත්වයක් ලබාගත යුතු අතර, ඔවුන්ගේ පත්වීම ස්ථිර කිරීම අනික් කරුණු අතර, සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී ;

(iii) ආධුනික සේවා කාලය තුළදී සේවය අසතුටුදායක වුවහොත් එසේ නැතහොත් සිංහල භාෂාව පිළිබඳ පරීක්ෂණයෙන් අසමත් ආධුනික සේවා කාලය ඇතුළත ඕනෑම අවස්ථාවකදී නැතහොත් අවසානයේදී සේවය නැවැත්විය හැකිය. එසේ වුවද රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගැනීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත්විය හැකි නම් සහ එසේම වැඩ සහ හැසිරීම සතුටුදායක වී නම් සේවය නැවැත්වීම කල් දැමිය හැකිය. එසේම නියමිත දිනයේ සිට සෑහෙන කාලපරිච්ඡේදයක් ඇතුළතදී පරීක්ෂණයෙන් සමත් වුව හොත් කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතා හානිය අත් හැර දැමිය හැකිය.

4. **සුදුසුකම්.**—

(i) අයදුම්කරුවෝ යහපත් චරියෙන් යුක්ත විය යුත්තාහ ;

(ii) අයදුම්කරුවෝ * ලාංකික විය යුත්තාහ ;

(iii) (ඒ) අයදුම්කරුවෝ මීට ප්‍රථම සත්වැනි පන්තියේ හෝ එයට වඩා උසස් විභාගයකින් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන්) සමත් වී සිටිය යුත්තාහ ;

(බී) ඔවුන්ට යටත් පිරිසෙයින් විදුලි ඉංජිනේරු සමාගමක් යටතේ හෝ චාර්ටඩ් ඉංජිනේරුවෙක් යටතේ හෝ රජයේ ආයතනයක හෝ ප්‍රාදේශීය සැපයීමේ බලමණ්ඩලයක් යටතේ හෝ (කම්බිකරුවෙකු හෝ විදුලි යතුරු පුවරුවක ක්‍රියා කරන්නෙකු හෝ වෙනයම් සමාන තත්ත්වයක සිටින්නෙකු වශයෙන් හෝ) අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය ;

(සී) ලංකා කාර්මික විද්‍යාලය මගින් "විදුලිය" පිළිබඳව පවත්වනු ලබන සන්ධ්‍යා වෘත්තීය පාඨම් මාලාව සම්පූර්ණ කළ අයදුම්කරුවන් නම්—විදුලි ඉංජිනේරු සමාගමක් යටතේ චාර්ටඩ් විදුලි ඉංජිනේරුවරයෙක් යටතේ හෝ රජයේ ආයතනයක් යටතේ හෝ ප්‍රාදේශීය සැපයීමේ බලමණ්ඩලයක් යටතේ හෝ අවුරුදු 2 ක ප්‍රායෝගික පළපුරුද්දක් සමග ;

(ඩී) අතිඝක්මතාව සහ අවශක්මතාව බෙදා හැරීමේ ක්‍රමය, විදුලිය පරිවර්තනය, ඩීසල් යන්ත්‍රාගාර සහ ස්විච් ගියර් ක්‍රියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව දැනීමක් හා පාරිභෝගිකයන්ගේ විදුලි රෝපණයක් සහ නිවාස සේවා මාපක පරීක්ෂා කිරීම පිළිබඳ දැනීමක් තිබිය යුතුය. ආරක්ෂක නීති සහ විදුලි උපකරණ සහ ගොඩනැගිලි සඳහා අයි ඊ. ඊ. රෙගුලාසි ගැන වැඩ කිරීමේ දැනීමක් ද තිබිය යුතුයි ;

(iv) 1966.8.17 වැනි දිනට අයදුම්කරුවෝ වයස අවුරුදු 20 ට නොඅඩු හෝ 40 ට නොවැඩි අයවිය යුත්තාහ. යුද්ධ සේවයේ සිටි අයදුම්කරුවන්ට තමන් පසුගිය යුද්ධයේදී ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි කාලය තම වයසින් අඩුකර ගත හැක.

සැ. යු.—(i) අවශ්‍ය කාර්මික දැනුම් හා පළපුරුද්ද තිබෙන ප්‍රාදේශීය බලමණ්ඩලයක් තුළ නගරයකට විදුලි ආලෝකය සැපයීමේ ක්‍රමයක් යටතේ ස්ථිර තනතුරු දරණ විදුලි පුවරු ක්‍රියාකරුවන්ට හෝ කම්බිකරුවන්ට හෝ සාමාන්‍ය අධ්‍යාපනික සුදුසුකම් නොමැති වුවද මෙම විභාගයට ඉල්ලුම් කළ හැකිය.

(ii) කොළඹ නාගරික සභාවේ මහජන ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිට, තනතුරු අහෝසිකිරීමේ හේතුවෙන් විශ්‍රාම යවනු ලැබූ ට්‍රොලි බස් රියැදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. නමුත් එසේ භාරගනු ලබන්නේ ඔවුන්ට 4 (i) (ii) සහ (iii) වැනි ඡේදයන්හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් ඇතොත් සහ 1966.8.17 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 50ට නොවැඩි නම් පමණි.

5. අයදුම් පත්.—

(i) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත්‍ර මෙහි සඳහන් ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, "සභාපති, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(ii) අයදුම්පත් 1966.8.17 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. ලියුම් කවරයේ වම්පස මුදුනේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුයි;

(iii) අයදුම් පත්‍රවල රුපියල් 5ක වටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගු කොට තිබිය යුතුයි;

(iv) දැනට රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් සිය අයදුම් පත්‍ර එවිය යුත්තේ තමන් දැනට සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලවල ප්‍රධානීන් මාර්ගයෙනි. මෙසේ කිරීමට යම් අයදුම්කරුවකු අපොහොසත් වුවහොත් ඔහු විභාගයට නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ. 1966.8.17 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ සිය අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන් වෙත සිය අයදුම් පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. (i) කිසිම ලියවිලි ආදියක් අයදුම්පතට අමුණා නොතිබිය යුතුය. එහෙත් වුවමනා කරුණු සියල්ලම අයදුම් පතෙහි සඳහන් කළ යුතුය;

(ii) විභාගයේදී සමර්ථතාවයක් දැක්වූවන් විසින් විභාගයට පෙනී සිටීමට ඔවුන්ගේ සුදුසුකම් ලියවිලිවලින් ඔප්පු කළ යුතුයි. ඔවුන් විසින් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

(iii) පහත සඳහන් ලියවිලි අවශ්‍ය වනවා ඇත:—

(ඒ) පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති තුමාට ඒත්තු ගතහැකි වන යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්, අයදුම්කරු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවල අධ්‍යාපනය ලැබුවෙක් නම්, ඔහු අන්තිම වරට ඉගෙනුම ලැබූ රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙන් ලැබූ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිනම් කැමැති පරිදි, අයදුම්කරුගේ ගුරුවරයාගේ හෝ පාඨශාලාචාර්යවරයාගේ හෝ රජයේ නිලධාරියෙකුගෙන් (වර්ෂයකට රු. 2,400 හෝ ඊට වැඩි වැටුපක් ලබන) හෝ සමාදාන විනිශ්චයකාරයෙකුගෙන් හෝ අධිනීතිඥවරයකුගෙන් හෝ නීතිඥයෙකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුගෙන් හෝ සාමාන්‍ය වශයෙන් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය හැකි ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙන් හෝ ලබාගත් චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් (පාඨශාලා භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ).

(සී) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත්‍ර;

(ඩී) හඳුනා ගැනීමේ පත්‍රය.

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියලුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලා සිටි විටෙක ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාදවන අපේක්ෂකයන්ගේ ඇතුළත්වීම අවලංගු කරනවා ඇත.

සැළකිය යුතුයි.—(ඒ) නියමිත ආකෘති පත්‍රයේ නොලියන ලද අයදුම් පත්‍ර භාරගනු නොලැබේ;

(බී) මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් භාරගනු නොලැබේ.

7. විභාගයට ඇතුළත් කර ගැනීම.—පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර විභාගය පරිපාලන සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්, නුසුදුස්සන් බවට පත්කරනු ලැබේ.

අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියම කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත්වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයත් සමග කාල සටහනේ පිටපතක්ද අයදුම්කරුවන්ට එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයෙහිදී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාර දිය යුතුයි.

විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍ර නොලැබුනහොත් ඒ බව වහාම—

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති,
තැ. පෙ. 530,
කොළඹ.

යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුයි:

(1) විභාගයේ නම:————.

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම:————.

(3) සම්පූර්ණ ලිපිනය:————.

සැළකිය යුතුයි.—විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සළකනු නොලැබේ.

8. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ, විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

9. අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් ඔවුන් දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත් සේවයෙන් පහ කරන්නට පිළිවන. සිතා මතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් ඒ සමානම දඬුවම් ලැබීමට පිළිවන.

10. මුදල් ආපසු දීම.—කවර කරුණක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු දෙනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.—ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් හා ප්‍රාදේශීය බලමණ්ඩලවල සභාපතිවරුන්ගෙන්, විශේෂ කොමසාරිස්වරුන්ගෙන් හා නාගරික කොමසාරිස්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

12. හඳුනා ගැනීමේ පත්.—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ:—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3ක කාල සීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්;

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3ක කාලසීමාවක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

13. විභාග පරිපාටිය :—

(ඒ) මෙම විභාගය කොටස් දෙකකින් යුක්තවේ. එනම් :—පළමු වැනි කොටස—ලිඛිත හා දෙවැනි කොටස—සම්මුඛ පරීක්ෂණය.

පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ ඒ එක් එක් විෂයයන් වෙනුවෙන් නියමිත ලකුණුත් ය. අශෝභන අත් අකුරු හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැන ද සියලුම ලිඛිත උත්තර පත්තරවලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස අකුරු ලියන ලද විභාග අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත්වීමට ඉඩ තිබේ :—

| | | ලකුණු |
|---|---|---|
| (i) පළමුවැනි කොටස (ලිඛිත) | ඉහත සඳහන් 4 (iii) වැනි ඡේදයේ (බී), (සී), (ඩී) යන අනු ඡේදයන් හි දැක්වෙන විෂයයන් සම්බන්ධයෙන් අයදුම්කරුගේ ප්‍රායෝගික හා සිද්ධාන්තික මූලික දැනුම පරීක්ෂා කිරීම සඳහා පැය දෙකහමාරක ප්‍රශ්න පත්‍රයක් ... | 150 |
| (ii) සම්මුඛ පරීක්ෂණය | පළාත් පාලන විදුලි ෆෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටීම සඳහා සමර්ථ විය යුතු විභාග වල මුල් සහතික පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි ... | 100 |

(බී) විභාගය පවත්වනු ලබන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන් ගෙනි.

14. ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් කොළඹ දී පවත්වනු ලබන පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව 'පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

15. සමත්වන අයදුම්කරුවන්ගේ නම් ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරනු ලැබේ. පුරප්පාඩු ඇතිවන අනුමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

16. වෛද්‍ය පරීක්ෂණය : තෝරගනු ලබන අපේක්ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික වශයෙන් යෝග්‍ය බව සනාථ කිරීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 ජූලි මස 20 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

**සැ. යු.**—විභාගය පිළිබඳ කිසිම ලිපියක් සභාපතිවරයාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

* පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන පදයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

විභාග අංකය :

## පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ සේවයේ 2 වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1966

### විභාගයට ඇතුළත් කර ගැනීමේ ඉල්ලුම් පත්‍රය

(ගැසට් නිවේදනයේ IV වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් නැති අයදුම්කරුවන් ඉල්ලුම් කිරීම අවශ්‍ය නැත.)

1. ඔබේ පුරුදු අත්සන :———.

(වාසගමේ මුල් අකුරු සහිත ඔබේ නම) :———.

(ඒ) වාසගම සහිත ඔබේ නම් සියල්ල සම්පූර්ණයෙන් :—. (පැහැදිලි අකුරෙන් ලියන්න.)

(බී) සම්පූර්ණ ලිපිනය :———. (වෙනස් වූ වහාම ඒ බැව් දන්විය යුතුයි.)

2. (ඒ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ :—

(i) පරම්පරාවෙන් ද :———.
නැතහොත්,
(ii) ලියාපදිංචි කිරීමෙන් ද, යන බව සඳහන් කරන්න :———.

(බී) උපන් ස්ථානය :—.

(i) අපේක්ෂකයාගේ :———.
(ii) අපේක්ෂකයාගේ පියාගේ :———.
(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ :———.

3. (ඒ) ඔබ උපන් දිනය :———.

දිනය :——, මාසය :——, වර්ෂය :——.

(බී) 1966 අගෝස්තු මස 17 වැනිදට ඔබේ වයස, වර්ෂවලින් හා මාස වලින් :———.

4. විභාගයට පෙනී සිටීමට අදහස් කරන්නේ නිවේදනයේ 4 (iv) ඡේදය යටතේ දැක්වෙන පරිදි සේවා මුත්ත අයට දෙනු ලබන අනුග්‍රහ යටතේ නම් පහත දැක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :—

(ඒ) සේනාංකය/දෙපාර්තමේන්තුව සහ නිලය/පදවිය :—

(බී) 1930 සැප්තැම්බර් 3 දා සිට 1949 දෙසැම්බර් 31 දා දක්වා කාලය තුළ සම්පූර්ණ ක්‍රියාත්මක සේවා කාලය :—

(සී) අඛණ්ඩ තාවකාලික සේවා කාලය :—

5. (ඒ) විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 4 වැනි ඡේදයේ පළමුවන සටහන යටතේ දී ඇති විශේෂ අනුග්‍රහ යටතේ නම් පහත දැක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :—

ඔබ පළාත් පාලන සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්—

(i) දරන තනතුර :———.
(ii) ඊට පත්වූ දින :———.

(බී) විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 4 වැනි ඡේදයේ දෙවැනි සටහන යටතේ දී ඇති විශේෂ අනුග්‍රහ යටතේ නම් පහත දැක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :—

(i) දැරූ තනතුර :———.
(ii) ඊට පත්වූ දිනය :———.
(iii) සේවය නතර කිරීමට හේතුව :———.

6. විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමණ මාධ්‍යයෙන්ද යන වග සඳහන් කරන්න :—

(ඒ) සිංහල :———.
(බී) ඉංග්‍රීසි :———.
(සී) දෙමළ :———.

7. (ඒ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :—

(බී) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :—

8. ඔබ මේ විභාගයට ඇතුළත් වීමට සුදුස්සකු වීම සඳහා සමර්ථ වී ඇති විභාගය පිළිබඳ විස්තර සහ පලපුරුද්ද (ගැසට් නිවේදනයේ 4(iii) ඡේදය බලන්න).

| | ප්‍රධාන | අතිරේක |
|---|---|---|
| (ඒ) විභාගයේ නම සහ දිනය :———. | | |
| (බී) මධ්‍යස්ථානය :———. | | |
| (සී) විභාග අංකය :———. | | |

9. කිසියම් වරදකට ඔබ කවදා හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේනම් හෝ සිතාසි නිකුත් කරනු ලැබ තිබේ නම් හෝ ඒ වග සඳහන් කරන්න. එසේ නම්, ඒ දිනයද වරද ස්වභාවයද උසාවියේ නමද, නඩු නොම්මරයද මෙහි දක්වන්න :—

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් සහතික කරමි. තවද මම මෙම විභාගය පිළිබඳ රෙගුලාසි වලට එකඟව ක්‍රියා කිරීමටද බැඳෙමි. එසේම මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන සේ සැළකීමට ඉඩ ඇති බවද මැනවින් දනිමි.

අයදුම්කරු අවශ්‍ය මුද්දර
(රු. 5/-) මෙහි අලවා
ඒවා මත අත්සන් කළ යුතුයි.

———,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :———.

**සංලක්ෂ්‍යය** :—අපේක්ෂකයින් විසින් මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ යුත්තේ තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානයා හෝ සමාදාන විනිශ්චයකාරවරයෙකු හෝ ආදායම් පාලන නිලධාරියෙකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හෝ රුපියල් 2,400 ක් හෝ ඉන් ඉහළ වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයෙහි නියුක්ත නිලධාරියෙකු හෝ යුද්ධ හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාර ලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිටය.

**අපේක්ෂකයා මෙම ඉල්ලුම් පත්‍රය යම්කිසි තැනැත්තකු ඉදිරිපිටදී අත්සන් කරයිද, ඒ තැනැත්තාගේ සහතිකය.**

........................පදිංචිකරුවකු වන.................නමැති අය, මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1966........... වැනි දින ඔහු මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

නම පදවිය හා තරාතිරම :—

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ සහතිකය**

මෙම අපේක්ෂකයා මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ 19................මස..............වැනි දින සිට.............. වශයෙන් ස්ථිර/තාවකාලික සේවයෙහි යෙදී සිටින බවද, ඔහුගේ සේවය සෑම විටම සතුටුදායකව පැවති බවද සහතික කරමි.

————,
ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.

නම :————.

ප්‍රා. බ. ම./දෙපාර්තමේන්තුව :————.

පදවිය :————.

දිනය :————.

සැ. යු.—

(i) මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදි වද, පැහැදිලිවද පුරවා 1966 අගෝස්තු මස 17 වැනි දිනට හෝ ඊට පෙර හෝ "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති, තැපැල් පෙට්ටිය 530, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. අවශ්‍ය තොරතුරු සියල්ල සඳහන් කොට නැත්නම්, ඉල්ලුම් පත්‍රය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් විනිශ්චයට භාජනකොට ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ තිබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරෙහි විභාගයේ නම සඳහන් කළ යුතුය;

(ii) ඉල්ලුම් පත්‍රය එවන කාලයේදී ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් ඉල්ලුම් පත්‍රය එවිය යුත්තේ තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානයාගේ මාර්ගයෙනි. ඉල්ලුම් පත්‍ර එවීමේදී මෙම ක්‍රියා මාර්ගය අනුගමනය නොකරන අපේක්ෂකයෙකු වෙතොත් ඔහු විභාගයට සුදුසුකම් නැත්තකු ලෙස සලකනු ලැබේ;

(iii) ලියවිලිවල පිටපත් මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා නොඑවිය යුතුයි;

(iv) මේ විභාගයේ රෙගුලාසිවලට අනුව යම් අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ සේ සලකනු ලැබේ. යම් අපේක්ෂකයකු දැන දැනම අසත්‍ය තොරතුරු පළ කොට තිබෙන බව පෙනී ගියහොත් හෝ යම්කිසි අවශ්‍ය කරුණක් කැමැත්තෙන්ම සඟවා තිබුණොත් හෝ විභාගයට පෙනී සිටියේ නුසුදුස්සෙකු හැටියට බව සේවා කාලය තුළ කවර අවස්ථාවකදී වුවද හෙළි වුවහොත් ඔහු වහාම සේවයෙන් නෙරපනු ලැබීමට ඉඩ තිබේ.

7–1628—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**I ශ්‍රේණියේ බෙහෙත් ශාලා භාර ආයුර්වේද වෛද්‍ය තනතුරු**

*1965.10.29 දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරන ලද නිවේදනයට වැඩිදුරටත් ය.

2. පහත සඳහන් නිලධාරීන් ඉහත තනතුරුවලට පත් කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇත :—

(i) එච්. පී. ජී. බී. ද අල්විස් මහතා II ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය, වේරගොඩ ගම්සභාව, කඟව—තෙල්වත්ත.

(ii) ඩබ්ලිව්. එච්. එස්. ගුණවර්ධන මහතා II ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය, පළාත් ආණ්ඩු සභාව, පානදුරය.

(iii) ඩී. විවේකානන්ද මහතා II ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය, නගර සභාව, කොළඹ.

මොවුනට වහාම පත්වීම් දීම සඳහා කොමිෂන් සභාව භාර නොගනියි. එසේ වුවද, පළාත් පාලන සේවයේ පුරප්පාඩු ඇතිවන පරිදි ඒ අවස්ථාවල පත්වීම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 ජූලි 19 දින,
තැ. පෙ. 530, කොළඹ.

7–1631—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්. සී—බී 14/64.
ප.පා.කො—15/2/8.

### පැල්මඩුල්ල සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥපනත**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ පැල්මඩුල්ල සුළු නගර සභාව විසින් සම්පාදිතව, ඒ ආඥපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

**උඩින් නැමී තිබෙන ගස්**

සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ යම් ගසකින් හෝ එබඳු ගසක යම් අත්තකින්, ගෙඩියකින් හෝ වෙන යම් කොටසකින් යම් ගොඩනැගිල්ලකට, නාප්පයකට හෝ කාණුවකට අලාභහානි සිදුවන හෝ සිදු විය හැකි කවර අවස්ථාවක දී වුවද, නැතහොත් එවැන්නක් එබඳු ගෙයක පදිංචිකරුවනට හෝ යම් පොදු මාර්ගයක ගමනාගමනයෙහි යෙදෙන අයවලුන්ට අන්තරායදායක වන හෝ අන්තරායදායක විය හැකි තත්ත්වයක පවත්නා කවර අවස්ථාවකදී වුවද සභාපති විසින් ඒ ගස පිහිටි ඉඩමේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමකින් ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළතදී, ඒ ගස හෝ අත්ත හෝ ගෙඩිය හෝ ගසේ වෙනයම් කොටස අවස්ථාචෝචිත පරිදි බැඳ ආරක්ෂා කිරීමට හෝ කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකි අතර ඒ දැන්වීම භාර දෙනු ලැබූ ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් එහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එහි නියමයන් ඉටු කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, සභාපති විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ කම්කරුවකු විසින් ඒ ඉඩමට ඇතුල්වී එකී අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ වියදමින්, ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කළ යුතු යයි ඒ දැන්වීමෙන් නියමිත දේ ඉටු කළ හැකිය. ඒ සඳහා දරනු ලබන වියදම සභාවට අය විය යුතු ණයක් හැටියට අයකර ගත හැකිය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ භාර දෙනු ලැබූ දැන්වීමක සඳහන් නියමයන් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඉටු කිරීම පැහැර හරින සෑම අයිතිකරුවකු හෝ පදිංචිකරුවකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කිරීමේදී රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් පැල්මඩුල්ල සුළු නගර සභාව අදහස් වේ.

7–1638—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී.බී. 122/37 .

## බණ්ඩාරවෙල නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය) වන නගර සභා ආඥාපනතේ 130 (ආ) සහ 153 වෙනි වගන්ති යටතේ බණ්ඩාරවෙල නගර සභාව විසින් පනවනු ලැබ එම ආඥාපනතේ 154 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹදී ය.

### අතුරු ව්‍යවස්ථාව

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130 (ආ) වගන්තිය යටතේ පනවනු ලැබ අය කරනු ලබන, 1965 නොවැම්බර් 5 වන දින අංක 14,550 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1965 ඔක්තෝබර් 22 වන දින දරන නිවේදනයේ සඳහන් 1966 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දෙන් මෙහි පහත උපලේඛනයේ සටහන් දේපළ නිදහස් කළ යුතුය.

### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරන දේපළ :—

#### අංක 1 දරන ඡන්ද කොට්ඨාශය

පන්සල පාර :—අංක 50/1

පූනාගල පාර :—අංක 45/1, 45/2, 45/3, 45/4, 45/7 සහ 8 ,45/9, 45/10, 55, 55/2, 55/3, 55/4, 55/5, 55/6, 55/8 සහ 55/10.

#### අංක 3 දරන ඡන්ද කොට්ඨාශය

පන්සල පාත් :—අංක 17, 17/1, 17/2, 23, 23/1, 25 සහ 26.

#### අංක 4 දරන ඡන්ද කොට්ඨාශය

වැලිමඩ පාර :—අංක 39/1, 41, 41/1, 41/2, 41/3, 41/4, 45, 45/4 සහ 55.

#### අංක 5 දරන ඡන්ද කොට්ඨාශය

ඇටැම්පිටිය පාර :—අංක 10, 10/1, 10/2, 10/3, 16, 24, 24/1, 24/2, 24/3, 24/4, 28, 30, 30/1, 32, 34 සහ 36.

#### අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය

අපර්ඩූයිව් පාර :—අංක 48.

7-1639—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ජී.—බී 34/45.

## රත්නපුර නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වන සහ 157 වන වගන්තිය යටතේ රත්නපුර නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 154 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 ජූලි මස 6 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1962 අප්‍රේල් 6 වන දින අංක 13,007 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත 1931 ඔක්තෝබර් 23 වන දින අංක 7,889 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ජල කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා, 51 වන අතුරු ව්‍යවස්ථාවට ඉක්බිති වම පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව එකතු කිරීමෙන් තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"52 සභාපතිගේ ලිඛිත අවසරයක් නොලැබ සභාවට අයත් යම් අගුලක්, හයිඩ්රාන්ට් දිය නලයක්, කරාමයක්, වැල්වයක්, නලයක්, කර්මාන්තයක් හෝ යන්ත්‍රයක් ඕනෑකමින්ම හෝ නො සැලකිල්ලෙන් කඩන, පලුදු කරන, විවෘත කරන, වසන හෝ අයුතු ලෙස එයට බාධා කරන හෝ එය අතපතගාන හෝ සභාවට අයත් ජලාශයකින් හෝ වෙන යම් කර්මාන්තයකින් ජලය ලබා ගන්නා හෝ, ජලය අපතේ යන අන්දමට හෝ ජලය සැපයීමට බාධා වන අන්දමට ඕනෑ කමින්ම වෙන යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කිරීමේ දී රුපියල් එකසියයකට වැඩි නොවන දඩයකට ද යටත් විය යුතු ය."

7-1637—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහ ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

### මඩකලපුව දිස්ත්‍රික්කය—වාලච්චේනෙයි ගම් සභාව

ප්‍රදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ, වාලච්චේනෙයි ගම්සභාවේ අංක 4 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා මොහමඩ් ඉස්මයිල්, මොහමඩ් අලියාර් මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 ජූලි 10 වැනි දින,
කොළඹ දී ය.

7-1647—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත
### (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස් (ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 ජූලි 10 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|

**කොළඹ දිස්ත්‍රික්කය**

**මහර ගම්සභාව**

7 ... සෙනරත් ආරච්චිගේ ජේබියන් පෙරේරා

**කළුතර දිස්ත්‍රික්කය**

**බේරුවල්-අළුත්ගම්-මාලේවන් බද්ද ගම්සභාව**

8 ... හාතාදුර පාර්ලිස් සිල්වා

**ගාලු දිස්ත්‍රික්කය**

**නාගොඩ ගම්සභාව**

11 ... ඉඳුරුවෙ මුල්ලේ ආරච්චිගේ ගුණසේකර දෙන් ප්‍රැන්සිස්

**පෝද්දල ගම්සභාව**

2 ... කොට්ටව ගමගේ ධර්මදස
7 ... ජූලියන්ගේ නොහොත් කෝරළේ කංකානංගේ ආරියදස

| කොට්ඨාශ අංකය | අපේක්ෂකයාගේ නම |
|---|---|

**බෝපෙ ගම්සභාව**

1 ... නාගහවත්ත විල්සන්

**මාතර දිස්ත්‍රික්කය**

**මාලිම්බඩ ගම්සභාව**

13 ... කුරුප්පුආරච්චි, ජේම්ස්

**යාපනය දිස්ත්‍රික්කය**

**මිරුසුවිල් ගම්සභාව**

6 ... කේ. සුන්දරම්

**යාපනය දිස්ත්‍රික්කය**

**නල්ලූර් ගම්සභාව**

11 ... ඇස්. වල්ලිපුරම්

**අම්පාර දිස්ත්‍රික්කය**

**නින්දවූර් ගම්සභාව**

6 ... මොහමඩ් කම්බි මිස්කින්බාවා

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**කුලියාපිටිය නගර සභාව**

8 ... අදිකාරි මුදියන්සේලාගේ පියසේන

**කෑගල්ල දිස්ත්‍රික්කය**

**කෝලන්ගමුව ගම්සභාව**

17 ... කස්තුරි අච්චිල්ලාගේ සෝමපාල

7-1646—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### දෙඩන්දූව උප නගර සභාව

**1966 තුන්වැනි පරිපූරක අය-වැය ලේඛනය**

**1 වැනි කොටස—සාමාන්‍ය**

| වැය ශීර්ෂය | | | ගණන රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—2 (එච්) ගණකාධිකාරි ගාස්තු | ... | ... | 676 | 59 |
| ඒ.—2 (ඇෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණය | ... | ... | 500 | 0 |
| බී.—2—මහා මාර්ග නඩත්තු කිරීම | ... | ... | 750 | 0 |
| ඩී.—2 (බී) කසල ශෝධන කරත්ත | ... | ... | 200 | 0 |
| ඩී.—3 (ඊ) වැසිකිළි නඩත්තු කිරීම | ... | ... | 200 | 0 |

1966 ජූලි 15 වැනි දින පවත්වන ලද දෙඩන්දූව උප නගර සභාවේ මාසික රැස්වීමේ යෝජනා අංක 6 යටතේ සභා සම්මත විය.

බී. ජේ. ජයවර්ධන
සභාපති,
උප නගර සභාව, දෙඩන්දූව.

1966 ජූලි 20.

7-1629—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

### අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාව

**පළමුවැනි අතිරේක අය-වැය ලේඛනය—1966**

| වැය ශීර්ෂය | | | | මුදල රු. | ශ. | | අනුග්‍රාහක බලය |
|---|---|---|---|---|---|---|---|
| සි 2—නඩත්තුව | ... | ... | ... | 1,500 | 0 | ... | 1966.4.26 දින රැස්වීමේ සම්මුති අංක 12 |
| ඩී 7—අළුත්වැඩ | ... | ... | ... | 4,000 | 0 | ... | එම |
| ඊ 2(ඒ) පඩිනඩි | ... | ... | ... | 2,800 | 0 | ... | 1966.3.27 දින රැස්වීමේ සම්මුති අංක 11 |
| ඊ 3(ඒ) පඩිනඩි | ... | ... | ... | 1,440 | 0 | ... | එම |
| ඊ 6(බී) නඩත්තුව | ... | ... | ... | 2,000 | 0 | ... | 1966.2.26 දින රැස්වීමේ සම්මුති අංක 11 |
| ඊ 6(ඩී) ජීවනාධාර හා වි. ජීවනාධාර | | ... | ... | 2,210 | 0 | ... | එම |
| | | | | 13,950 | 0 | | |

1966 ක්වූ ජූලි මස 19 වැනි දින,
අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේදීය.

පී. එච්. ආර්. සුමනදස,
අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභාවේ
වැඩ බලන සභාපති.

7-1640—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## අකුරැස්ස සුළු නගර සභාව

**1966 වර්ෂයේ දෙවැනි පරිපූරක අයවැය ලේඛනය**

1 වැනි කොටස

| වැය ශීර්ෂය | | යෝජිත වැය රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 2. (ඩී).— | තක්සේරු ගාස්තු ... ... | 1,000 | 0 |
| බී. 1. (සී).— | කම්කරුවන් ... ... | 750 | 0 |
| බී. 2.— | නඩත්තු කිරීම (සංඥා පුවරු සවිකිරීම) | 1,750 | 0 |
| සී. 4.— | නඩත්තු කිරීම (බස් නැවතුම් පොළ) ... | 3,250 | 0 |
| ඩී.2. (බී).— | කුණු ඇදීමට අත් කරත්තයක් ගැනීම ... | 425 | 0 |
| ඩී. 6. (ඒ).— | වේතන (ආයු : වෛද්‍ය සහකාර ගෙ. කු. දීමනා සමග) ... ... | 258 | 0 |
| ඩී. 6. (බී).— | නඩත්තු කිරීම (ඖෂධ වර්ග සැපයීම සහ ලී බඩු සැපයීම) ... ... | 6,000 | 0 |
| ඇජ්. 3.— | සුසාන භූමි තැනීම (ප්‍රතිඥා වැය මුදල) ... | 1,000 | 0 |
| ජී. 1.— | බල්ලන් විනාශ කිරීම ... ... | 600 | 0 |
| | එකතුව | 15,033 | 0 |

1966.6.27 දින පැවැත් වූ සභා රැස්වීමේදී ප. පා. ස. කොමසාරිස්තුමාගේ සංශෝධනයට යටත්ව සභාව විසින් පිළි ගනිමින් සම්මත කර ගන්නා ලදී.

ඩී. ඒ. සූරියආරච්චි,
සභාපති,
අකුරැස්ස සුළු නගර සභාව.

1966.6.28 දින.

සංශෝධනය කර අනුමත කරන ලදී.

එච්. ඒ. පී. අභයවර්ධන,
ප. පා. ස. කොමසාරිස්,
දකුණු දිසාව (පහළ)

මාතර. 1966.7.18.

7-1652—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## මිණුවන්ගොඩ සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පතයි**

### අය-වැය ලේඛනය—1966

1966 වර්ෂයේ අයවැය ලේඛණයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන්කරන ලද මුදලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේවූ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට වර්ෂ 1966 ක්වූ ජූලි මස 10 වන දින පැවැත්වුණු විශේෂ සභා රැස්වීමේ අංක 5 දරණ යෝජනාවෙන් සභා සම්මත වී තිබේ.

1 වන කොටස—සාමාන්‍ය අංශය

**ඉතිරි මුදල් වැය ශීර්ෂය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ. 4 | ආධාර හා දීමනා ... ... ... | 200 | 0 |
| බී. 2 | මහා මාර්ග නඩත්තු කිරීම ... ... | 1,000 | 0 |
| ඩී. 1එච් | කාණු ඉදිකිරීම ... ... ... | 1,000 | 0 |
| ඩී. 5සී | ජල සම්. නඩත්තු කිරීම ... ... | 1,300 | 0 |
| ඩී. 7ජී | වෙ. පො. ණය ගාස්තු ... ... | 2,200 | 0 |
| | එකතුව ... | 5,700 | 0 |

**වැඩිපුර මුදල් වැය ශීර්ෂය**

| | | රු. | ශ |
|---|---|---|---|
| බී. 7 | ම. මාර්ග අයත්කර ගැණීම් ... ... | 500 | 0 |
| සී. 4 | න. ස. ගො. නඩත්තු කිරීම ... ... | 2,000 | 0 |
| ඩී. 7බී | වෙ. ගා. නඩත්තු කිරීම ... ... | 2,000 | 0 |
| ජේ. 3 | පොත් පත් හා සඟරා ... ... | 1,200 | 0 |
| | එකතුව ... | 5,700 | 0 |

ඩී. ඩී. විජේතුංග,
සභාපති,
මිණුවන්ගොඩ සුළු නගර සභාව.

1966 ජුලි මස 19 වන දින,
මිණුවන්ගොඩ සුළු නගර සභා කාර්යාලයේදී.

7-1635—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

**1966 වර්ෂයේ පළමු වැනි පරිපූරක අය වැය ලේඛණය**

1 වැනි කොටස — සාමාන්‍ය

| වැය ශීර්ෂය | | මුදල රු. | ශ. | | |
|---|---|---|---|---|---|
| ඒ2 (බී) | ගමන් ගාස්තු ... ... | 500 | 0 | | |
| ඒ2 (ඩී) | තක්සේරු කරන්නන්ගේ ගාස්තු ... | 1,063 | 0 | | |
| ඒ2 (එච්) | ගණන් පරීක්ෂණ ගාස්තු ... | 233 | 0 | | |
| සී4 | නඩත්තු කිරීම ... ... | 200 | 0 | | |
| ඩී3 (සී) | උපකරණ ... ... | 300 | 0 | | |
| ඩී5 (සී) | නඩත්තු කිරීම ... ... | 1,000 | 0 | | |
| | | | | 3,296 | 0 |

1966 ජූනි මස 29 වැනි දින පැවැත්වූ මාසික රැස්වීමේ අංක 10 දරණ යෝජනාවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සභා සම්මත විය.

ඩී. ඇම්. හේමපාල,
සභාපති,
රුවන්වැල්ල සුළු නගර සභාව.

1966 ජුලි මස 10 වැනි දින,
රුවන්වැල්ල සුළු නගර සභා කාර්යාලයේදී ය.

අනුමත කරන ලදී.

ඇල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා,
(සබරගමු කොට්ඨාශය).

1966 ජුලි මස 20 දින,
රත්නපුරයේ දීය.

7-1458—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## හපුතලේ නගර සභාව

### නගර සභා ආඥාපණත (255 වෙනි පරිච්ඡේදය)

මෙම ගැසට් නිවේදනය පළවූ දින සිට අයකර ගැනීමට හැකි වනසේ, හපුතලේ නගර සභාව විසින්, නගර සභා ආඥාපණතේ (255 වෙනි පරිච්ඡේදය) 162 සහ 164 යන වගන්ති යටතේ පහත සඳහන් බලපත්‍ර ගාස්තු පනවන ලදී:—

(1) මෙහි පහත උපලේඛණයේ සඳහන් බලපත්‍ර සඳහා දැනට අයකරනු ලබන බලපත්‍ර ගාස්තු වෙනුවට එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු අයකිරීම,

(2) 1953.9.4 වෙනි දින අංක 10,586 දරණ ගැසට් පත්‍රයේ හා 1957.12.20 වෙනි දින අංක 11,221 දරණ ගැසට් පත්‍රයේත් පළ කරන ලද බලපත්‍ර ගාස්තු මෙම නිවේදනයෙන් අවලංගු කරන ලදී.

එම්. එච්. සමයදාස,
සභාපති.

නගර සභා කාර්‍යාලය,
හපුතලේ,
1966.7.19 දින.

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|
| පහත සඳහන් කාර්‍යයන් සඳහා ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙන බලපත්‍රය :— | |
| ලියාපදිංචි කරන ලද සමාගමක් මගින් කම්මලක් පවත්වාගෙන යෑමට ... ... | 250.00 |
| මුද්‍රණාලයක් තබා ගැනීමට ... ... | 50.00 |

7-1632—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## පොල්ගහවෙල සුළු නගර සභාව

### ජලභීතිකා රෝගය

පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක ඉබාගාතේ ඇවිදින, දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ II වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයේ පලවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

ආර්. ඒ. සිරිසේන,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

1966.7.18
සුළු නගර සභා කාර්‍යාලය,
පොල්ගහවෙල.

7-1644—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කණුවන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මතකරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසැට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 හේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසැට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශකරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසැට් පත්‍රයේ පළවනදින සිට සම්මතකරගැනීමට කණුවන ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ඇස්. පී. අමරසේකර,
සභාපතිතැන.

1966 ජූලි මස 15 වැනි දින,
කණුවන ගම්සභා කාර්යාලයේදීය.

7-1645—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## මතුගම සුළු නගර සභාව

### පිස්සු බලු උවදුර පිළිබඳ දැන්වීමයි

මතුගම සුළු නගර සභා ප්‍රදේශය 1966 ජූලි මස 15 වැනි දින සිට පිස්සු බලු උවදුර පවතින හෝ ඇතිවීමට ඉඩ ඇති ප්‍රදේශයක් ලෙස ලංකා නීති සංග්‍රහයෙහි 476 වැනි පරිච්ඡේදය වන පිස්සු බලු ආඥා පනතේ 11 වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරමි.

යථෝක්ත ප්‍රාදේශය තුල, පුද්ගලික ගොඩනැගිල්ලක හෝ ගෙමිදුලක හෝ ඉඩමක හෝ නොවන ප්‍රසිද්ධ ස්ථානයකදී හෝ මාර්ගයකදී හෝ වෙනයම් ස්ථානයකදී හෝ හමුවන, පටියකින් බැඳගෙන හෝ කෙනෙකු විසින් ගෙනයනු නොලබන ඕනෑම සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) දුටු වහාම මරා දැමීමට සිදුවන බව මෙයින් දන්වමි.

මෙම ප්‍රකාශය අද සිට 1966 දෙසැම්බර් 31 වැනි දින දක්වා වලංගු වන්නේ ය.

සුනඛයන් ඇති කරන අය විසින් තම සුනඛයන්ට පිස්සු බලු රෝගය වලකන බෙහෙත් එන්නත් කරවා ගැනීමට සුදුසු දිනයන් මතුගම සුළු නගර සභා කාර්යාලයෙන් විමසා ලබා ගත යුතුයි.

දයා වී. පස්කුවල්,
මතුගම සුළු නගර සභාවේ සභාපති.

1966 ජූලි මස 15 වැනි දින,
මතුගම සුළු සභා කාර්යාලයේදීය.

7-1643—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## 1952 කේ අංක 6 දරන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ මුල්ලියවලෙයි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල II, VII, XII, XVII, XVIII, XXIX, XXXV කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මුල්ලියාවලෙයි ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

කේ. සෙල්ලතම්බි,
සභාපතිතැන.

1966.7.20 වැනි දින,
මුල්ලියාවලෙයි ගම් සභා කාර්යාලයේ දී ය.

7-1634—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

වර්ෂ 1957 අංක 59 දරන විදුලිය බල (සංශෝධන) පනතින් සංශෝධිත වර්ෂ 1950 අංක 19 දරන විදුලිය බල පනතේ 9 වැනි ඡේදය සහ ඒ යටතේ අංක 10,899 සහ 1956 මාර්තු 2 දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසින් ප්‍රකාර මා වෙත පැවරී ඇති බලය අනුව, කුරුණෑගල මහ නගර සභාවට නිකුත් කර ඇති විදුලිය බලපත්‍රයේ (අ) උප ලේඛනයේ සඳහන් විදුලිය සැපයීමේ බලයලත් ප්‍රදේශය දීර්ඝ කිරීම සම්බන්ධව ඉහත සඳහන් රෙගුලාසින් යටතේ 1966 අගෝස්තු මස 13 වැනි දින පෙරවරු 10.30 ට කුරුණෑගල මහ නගර සභා කායාලයේදී විභාගයක් පවත්වන බව සියළු දෙනාටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

**දීර්ඝ කිරීමට යෝජිත ප්‍රදේශවල මායිම් :—**

පුත්තලම පාර : මහ නගර සභා සීමාවේ සිට පුත්තලම පාරේ මාස්පොත දක්වා සැතපුම් 3 ක් දුරට සහ එම පාරේ මැද සිට යාර 100 බැගින් දෙපසට.

මීගමුව පාර : මහ නගර සභා සීමාවේ සිට මීගමුව පාරේ සැතපුම් 3 ක් දුරට සහ එම පාරේ මැද සිට යාර 100 බැගින් දෙපසට.

කොළඹ පාර : මහ නගර සභා සීමාවේ සිට කොළඹ පාරේ සැතැපුම් 3 ක් දුරට සහ එම පාරේ මැද සිට යාර 100 බැගින් දෙපසට.

නුවර පාර : මහ නගර සභා සීමාවේ සිට නුවර පාරේ සැතැපුම් 3 ක් දුරට සහ එම පාරේ මැද සිට යාර 100 බැගින් දෙපසට.

මෙම විභාගය සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට කැමති සියළුම පුද්ගලයින් පිටපත් තුනකින් සමන්විත එම කරුණු කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන විදුලිය පරීක්ෂක තැන, තැ. පෙ. 540, කොළඹ යන ලිපිනය සඳහන් ලිපිය 1966 ජූලි මස 30 වැනි දින පෙරවරු 10 ට පෙර විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලයට බාරදිය යුතුය. නැතහොත් ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

කරුණු සම්බන්ධව වැඩිමනත් විස්තර මෙම දැන්වීමේ පළමුවැනි කොටසේ සඳහන් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසින් බලනු මැනවි.

එස්. මුරුගේසු,
විදුලිය පරීක්ෂක.

ප්‍රධාන විදුලිය පරීක්ෂක තුමාගේ කාර්යාලය,
තැ. පෙ. 540, කොළඹ,
1966 ජූලි 15 වැනි දින දී ය.

7-1449—66.7.29 දින අංක 14,706 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අයවෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක **මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි